# ධීවර දිවියට එළියක්

අනුර සමරවීර

ජගත් ධීවර දිනය මෙම මස 21 දිනට යෙදී තිබේ. ධීවර කර්මාන්තයේ වර්ධනය උදෙසා ඉටුකළ යුතු සේවාවන් පිළිබඳව මෙන් ම ඊට ඇති අභියෝග ජයගැනීම ද ජගත් ධීවර දිනයේ අපේක්ෂාවන් අතර වේ.

අප ජීවත්වන ලෝකයෙන් 72% ක් පමණ ජලයෙන් වැසී පවතී. එහි වැඩි ප්‍රමාණයක් විශාල සාගර හා මුහුදු වශයෙන් පවතින අතර ඊට අමතරව ගොඩබිම ඇති වැව්, ගංගා ආදියක් ද මිනිසා තම අවශ්‍යතා රැසක් ඉටුකර ගනී. ඒ අතරින් ධීවර කර්මාන්තයට ද ප්‍රධාන ස්ථානයක් හිමි වේ.

මසුන් ආහාරයට ගැනීමට මිනිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම පුරුදු වී සිට ඇති බවට සාක්ෂි තිබේ. අතීතයේ දී සාම්ප්‍රදායික ක්‍රම මගින් පමණක් මසුන් අල්ලීමට පුරුදු වී සිටි මිනිසුන් දැන් නවීන තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් ධීවර කර්මාන්තයෙහි යෙදී සිටී. දෙවන ලෝක සංග්‍රාමයෙන් අනතුරුව ඇතිවූ කාර්මික විප්ලවයත් සමඟ නවීන යාන්ත්‍රික උපකරණ හා තාක්ෂණ උපක්‍රම මගින් ධීවර කර්මාන්තයෙන් වැඩි ආදයමක් උපයා ගැනීමට බොහෝ රටවල අවධානය යොමු විය. කෙසේ වෙතත් ලොව සංවර්ධිත රටවල් ධීවර කර්මාන්තයෙන් සීමා රහිතව ඵල නෙලා ගැනීමට උත්සාහ කිරීම හේතුවෙන් මේ වනවිට එහි අනාගතයට අභියෝග රැසක් එල්ල වී තිබේ.

ධීවර කර්මාන්තය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙද දැක්විය හැකි ය.

(1) මිරිදිය ධීවර කර්මාන්තය
(2) කරදිය ධීවර කර්මාන්තය
(3) කිවුල්දිය ධීවර කර්මාන්තය

ලෝකයේ මිරිදිය ධීවර කර්මාන්තය මේ වනවිට සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වී පැවතුන ද වඩා වැඩි අවධානයක් යොමුවී පවතින්නේ කරදිය ධීවර කර්මාන්තය සම්බන්ධයෙනි. එසේම නොගැඹුරු කලපු හා මෝයවල ඇති කරදිය හා මිරිදිය මිශ්‍ර වූ ජලාශවල එනම් කිවුල්දිය ජලාශවල වැඩෙන ඉස්සන්, පොකිරිස්සන් හා කකුළුවන් මගින් ආදයම උපදවන කිවුල් දිය ධීවර කර්මාන්තය සඳහා ද මේ වන විට හොඳ ආදායම් තත්ත්වයක් පවතී.

මීට අඩ සියවසකට ආසන්න කාලයක් දක්වාම ලංකාව ඇතුළු ලොව බොහෝ සංවර්ධනය වන රටවල ධීවරයන් මසුන් මැරීම සඳහා යොදගනු ලැබුවේ සාම්ප්‍රදායික ක්‍රමයන් ය. බොහෝවිට ඒ සඳහා පාරම්පරිකව තිපදවා ගත් උපකරණ ප්‍රයෝජනයට ගැනිණ. අප රටේදී මේ සඳහා යොද ගත් ශිල්පීය ක්‍රම ධීවර පත්තය ලෙස හඳුන්වයි.

එහිදී මිරිදිය ධීවර කර්මාන්තය 'වැව් පත්තය' ලෙස ද කරදිය ධීවර කර්මාන්තය 'මුහුදු පත්තය' ලෙස ද හැඳින් වේ. කිවුල්දිය ධීවර කර්මාන්තයට සම්බන්ධ 'කලපු පත්තයද' වැව් පත්තයට ම සම්බන්ධ පත්තයක් වේ. කලපුව හා වැව් පත්තයේදී මාළු ඇල්ලීම සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රම රැසකි. විසි දැල, කඩිප්පු දැල, පලා දැල ආදී දැල් දැමීම, හුලු දැල් පැත්තිල්ල, කට්ටි දැල් පත්තය මංඩාව, හුලුපැම, ජා-කොටු දැමීම, අඟුළු කොටු හිටවිල්ල, මුරල් පිති පාකිරිල්ල, කරක් ගැසීම හා බිලිබෑම් ඉන් කිහිපයකි. මේ සඳහා කෙමන මන්ද, කකුළු වට්ටි, අනංගුව, කරක්ගෙඩිය, ඇවැලුන් බිලිය, පරාකුඩ වැනිදෑ පාරම්පරික ධීවර පත්ත වශයෙන් ද යොද ගැනුනි.

මහාද්වීප තටාකය නමින් හඳුන්වන නොගැඹුරු මුහුදු කලාප, මසුන් බහුලව ජීවත්වන කලාපය ලෙස පිළිගැනේ. නොගැඹුරු මුහුදු පත්ලට හිරුඑළිය වැටීම හා මත්ස්‍ය ආහාර මේ ප්‍රදේශයේ බහුලව පැවතීම හේතුවෙන් මේ කලාපය මසුන්ගෙන් පිරී පවතී.

මුහුදු පත්තයේ දී ප්‍රධාන ප්‍රභේද පහක් විය. ඒ මා දැල් හෙවත් ගොඩ-දැල් පත්තය සිල්ලර හෙවත් සුළු පත්තය, ගල්මාළු හෙවත් ගොඩ රස්සාව, ඔරු පත්තය හා බෝට්ටු පත්තය වශයෙනි.

1957 වර්ෂය තෙක් අප රටේ ධීවරයන් මුහුදු මසුන් මැරීම සඳහා යොද ගනු ලැබුවේ සාම්ප්‍රදායික යාත්‍රා පමණකි. එනම් ඔරු, රුවල් ඔරු, පාරු, පල්ලම්, ආදියයි. පසු කලෙක එවැනි සමහර යාත්‍රා සඳහා ඇන්ජින් සවිකිරීමක්, නවීන මෝටර් බෝට්ටු භාවිතය ඇරඹීමත් හේතුවෙන් ඈත දියඹට ගොස් මසුන් මැරීමට ඔවුනට හැකි විය. දැන් ප්‍රයෝජනයට ගන්නා යාන්ත්‍රික බෝට්ටු ප්‍රධාන වශයෙන් වර්ග හතරකට බෙද දැක්විය හැකිය. එනම්

(1) ඇන්ජින් සවිකරන ලද පාරම්පරික යාත්‍රා
(2) එක්දින යාත්‍රා
(3) ෆයිබර් ග්ලාස් වලින් තිපදවූ බෝට්ටු
(4) බහු දින යාත්‍රා වශයෙනි.

කරදිය ධීවර කර්මාන්තය ද ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකිය. ඒ

(1) නොගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය
(2) ගැඹුරු මුහුදේ ධීවර කරමාන්තය වශයෙනි

මේ අතරින් මහාද්වීප තටාකය නමින් හඳුන්වන නොගැඹුරු මුහුදු කලාප, මසුන් බහුලව ජීවත්වන කලාපය ලෙස පිළිගැනේ. නොගැඹුරු මුහුදු පත්ලට හිරුඑළිය වැටීම හා මත්ස්‍ය ආහාර මේ ප්‍රදේශයේ බහුලව පැවතීම හේතුවෙන් මේ කලාපය මසුන්ගෙන් පිරී පවතී. අපේ රට වටා ඇති මේ කලාපයේ මත්ස්‍ය වර්ග 500 ක් පමණ වෙසෙන බව විශ්වාස කෙරේ. එබැවින් ධීවරයන්ට බෝට්ටු මගින් මේ කලාපයේ ධීවර කර්මාන්තයේ යෙදීමෙන් හොඳ අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන.

අනන්‍ය ආර්ථික කලාපය නමින් හඳුන්වන කලාපයට පිටින් ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි යෙදීම සඳහා නවීන මෙවලම් සහිත යාත්‍රා ප්‍රයෝජනයට ගැනීමට සිදු වේ. ශීතාගාර පහසුකම් සහිත බහුදින යාත්‍රා මගින් අපේ ධීවරයන් ද ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි යෙදෙයි. කෙසේ වෙතත් සමහර සංවර්ධිත රටවල් විසින් නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් මහා පරිමානයෙන් ගැඹුරු මුහුදේ සිදුකරන මත්ස්‍ය දඩයම් හේතුවෙන් ධීවර කර්මාන්තයට විශාල අභියෝගයක් පවතී.

එක්සත් ජාතීන්ගේ සාගර නීති පිළිබඳ සම්මුතියේ ප්‍රතිඵලයක් ලෙස 1982 වර්ෂයේ සිට නාවික සැතපුම් 200 ක මුහුදු කලාපයක් ශ්‍රී ලංකාවට හිමි විය.

අනන්‍ය ආර්ථික කලාපය නමින් හඳුන්වන වර්ග කිලෝමීටර් භාරලක්ෂ තිස්හත් දහසක ප්‍රදේශයක් පුරා පැතිරී පවතින මේ කලාපය තුළ මසුන් මැරීමට අවසර පවතින්නේ ශ්‍රී ලාංකික ධීවරයන්ට පමණකි. සාම්ප්‍රදායික හා නූතන ධීවර කර්මාන්තය පිළිබිඹු කරන මුද්දර රැසක් හා මුද්දර ලෝකය තුළින් ද දිස් වෙයි. එවැනි මුද්දර කීපයකි මේ. ❑

(ධීවර කමාන්තය හා සම්බන්ධ මුද්දර කවරයේ පසු පිටුවේ)